16573
91.11.29

# පාලි ලේඛන සටහන

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
පශ්චාද් උපාධි ඩිප්ලෝමා සඳහා
ඉදිරිපත් කරන ලද නිබන්ධය.

CR

විභාග අංකය:= පශ්.ඩි.875
ලියාපදිංචි අංකය:= ශි.4411

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය
ගංගොඩවිල
නුගේගොඩ.

116573

1982.09.10.

# පා ළි අ ට්ඨ ක

( ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ

ශාස්ත්‍රපති උපාධිය සඳහා

ඉදිරිපත් කරන ලද

නිබන්ධනය )

උපාධි අපේක්ෂක

ගොඩගම චූලාලංකාර හිමි

(විභාග අංකය: S P A 275)

1980

CR

ලංකා

# පටුන

පිටු

කිවයුත්ත

1. අෂ්ටක ආරම්භය

2. අෂ්ටකයේ සංඛ්‍යා නියමය

3. අෂ්ටක විකාශනය

4. පාළි අට්ඨක බිහිවීම

5. පාළි අට්ඨක ව්‍යාප්තිය

6. පාළි අට්ඨක හා රතන සූත්‍රය

7. පාළි අට්ඨක භාෂාව

8. පාළි අට්ඨකයන්හි වෘත්ත විභාගය

9. පාළි අට්ඨකයන්හි ආයාචිත දෙවිවරු

10. පාළි අට්ඨකයන්හි සමාජ පසුබිම

පරිශිෂ්ටය 1 = උපසම්පදා ප්‍රබන්ධයක්

පරිශිෂ්ටය 11 = සියම් රටින් උපසම්පදාව දීම සඳහා පැමිණි හිමිවරුන්ගේ නාම මාලාව

පරිශිෂ්ටය 111 = සංශෝධිත පාළි අට්ඨක

පරිශිෂ්ටා 1v = දැනට සොයාගෙන ඇති පාළි අට්ඨක නාමාවලිය.

## කිවයුත්ත

ලංකාවේ විහාරස්ථානවල සැඟවී තිබුනු පුස්කොළ පොත්වල නාමාවලියක් සකස්කර ක්‍රි.ව.1959 දී"ලංකාවේ පුස්කොළ පොත් නාමාවලිය"(ප්‍රථමභාගය) මුද්‍රණය කරවීමෙන් එවකට පේරාදෙණියේ ලංකා විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ උපප්‍රධාන කේ.ඩී. සෝමදාස(බී.ඒ.,ඇම්.ඇස්)මහතා සිදුකළේ උදාර ශාස්ත්‍රීය සේවයකි.මක්නිසාදයත්,තම විහාර පොත්ගුල්හි කවර කවර පොත් තිබේදැයි බොහෝ විහාරාධිපතීන් වහන්සේලා පවා දැන නොසිටියහ.බාහිර අය ගැන කියනුම කවරේද?

සෝමදාස මහතාගේ ඉල්ලීම පරිදි,අප මාතර හිත්තැටියේ රජමහා විහාරයේ තිබෙන පුස්කොළපොත්වල නාමාවලිය සකස්කිරීම මවිසින් සිදුකරන ලදී. මා ඒ අවස්ථාවේ ප්‍රාචීන මධ්‍යම විභාගයට සූදානම් වෙමින් සිටි නමුත්,පොත්පත් වලට ඇති ආශාව නිසා ඒ කාර්යය ඉටුකර දෙනලදී.මෙසේ පුස්කොළපොත් එකින් එක අවුස්සා බලමින් සිටියදී"පාළි අට්ඨක" එකොළසක් සහිත පුස්කොළපොතක් මට හමුවිය.ඒවනවිට වැඩිපුර ප්‍රසිද්ධියක් නොමැතිව තිබූ මේ පාළි අට්ඨක එකතු කර මුද්‍රණය කරවුවොත් කෙතරම් හොඳදැ?යි මට එදා සිතිණ.නමුත් ඉගැනීම ආදී පෞද්ගලික කාර්යයන් නිසා ඒ අදහස යටපත් විය.

මෙසේ කලක් ගතවෙත්ම,මා පෙනී සිටින"ශාස්ත්‍රපති"උපාධියට අවශ්‍ය නිබන්ධය සඳහා අර පාළි අට්ඨක තෝරාගතහොත් හොඳයයි මට අදහස්විය. අප්‍රකටව පවතින පාළි සාහිත්‍යාංගයක් මතුකර ඒ මගින් පාළි සාහිත්‍යයට සේවයක් සැලසීම එසේ"පාළිඅට්ඨක"මාගේ ශාස්ත්‍රපති නිබන්ධය සඳහා තෝරාගැනීමට බලපෑ හේතුවය.මෙතරම් කරදර නැති මාතෘකා වලට තිබියදී මේ මාතෘකාව තෝරාගැනීමයි එක් අතකින් මේ නිබන්ධය ප්‍රමාදවීමට හේතුවූයේ.

පාළි අට්ඨක පුස්කොළපොත් එක් විහාරස්ථානයක නොමැත.ඒවා පිටපත් කර ගැනීම සඳහා ඒවා තිබෙන විහාරස්ථානවලට යායුතුවේ.එසේ ගියද එය එක්වරටම ලබාගැනීම දුෂ්කරය. මේනිසා ඇතැම් විහාරස්ථානවලට දෙතුන්වර යාමට සිදුවිය.

කෙසේ වුවද, පාළි අක්ෂර පිටපත් කරගැනීම සඳහා අත් පිටපත් ලබා ගැනීමට සහායවූ සියලු විහාරාධිපතීන් වහන්සේලාටම මාගේ කෘතඥතාව හිමි කරමි.

තවද, මෙහිලා කිවයුත්තක් නම්, මෙම නිබන්ධයේ වැඩි වශයෙන් ඇත්තේ පාලි පාඨ හෙයින් ඒවා යතුරුලියනය කිරීමේදී මහත් ආයාසයක් දැරීමට සිදුවීමය. බැඳි අකුරු සහිත වචන යතුරු ලිවීම බෙහෙවින් දුෂ්කර බව කිවමනා නොවේ. එසේම යතුරු ලියනවල අපට අවශ්‍ය සියලු අකුරුද නොමැත. මේ නිසා ඇතැම් විට බැඳි අකුරු වෙනුවට හල් අකුරු සහිත පාලි වචන යෙදීමට ද සිදුවිය.

මෙම නිබන්ධය සැලකිල්ලෙන් යතුරු ලියනය කර දුන් කඹුරුපිටියේ විද්‍යානිකේතන විද්‍යායතන පිරිවෙණේ කථිකාචාර්ය පල්ලාවෙල රාහුල ආයුෂ්මතුන්ටත් මාතර ශ්‍රී සුදර්ශී විද්‍යායතන පිරිවෙණේ පස්ගොඩ අස්සජි ආයුෂ්මතුන්ටත් මාගේ කෘතඥතාව හිමිවිය යුතුය.

මෙහිලා මුලදීම උපදේශකත්වය දැරූ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ අධ්‍යයනාංශ ප්‍රධානව සිටි ( පසුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ උපකුලපති) මහාචාර්ය ජේ. පිනදාස පෙරේරා මහතාටත් , එතුමාගෙන් පසුව එම අධ්‍යයනාංශයේ ප්‍රධානත්වය දරණ ආචාර්ය චන්ද්‍රා වික්‍රමගමගේ මහතාටත් අතිශයින් කෘතඥ වෙමි.

ගොඩගම පුඥාලංකාර භික්ෂු

රජමහාවිහාරය,
හිත්තටිය,
මාතර.
1982.09.30